# විප්ලවවාදී තත්වයක් යනු කුමක් ද?

**ලියොන් ට්‍රොට්ස්කි විසිනි**

1931 නොවැම්බර් 17

1. විප්ලවවාදී දෘෂ්ටි ආස්ථානයක සිට තත්වයක් විශ්ලේෂණය කිරීමේ දී විප්ලවවාදී තත්වයක ආර්ථික හා සමාජ පූර්වාවශ්‍යතා සහ විප්ලවවාදී තත්වයක් මත් අතර වෙනස හඳුනා ගැනීම අවශ්‍ය ය.
2. පොදුවේ කතා කරන විට දී විප්ලවවාදී තත්වයක ආර්ථික හා සමාජ පූර්වාවශ්‍යතා තහවුරු වන්නේ රටේ නිෂ්පාදන ශක්තීන් ක්ෂය වී යද්දී ය; ලෝක වෙළඳ පොළ මත ධනපති රටක සුවිශේෂ බර ක්‍රමයානුකූලව හීන වී එපරිද්දෙන් ම පන්තීන්ගේ අය මාර්ග ක්‍රමානුකූලව අඩු වී යද්දී ය; විරැකියාව හුදෙක් අවස්ථානුගත උච්චාවචනයක ප්‍රතිඵලයක් නො ව, එය වැඩී යාමේ ප්‍රවණතාවයකින් යුත් ස්ථාවර සමාජ විපතක් වන විට දී ය. මෙය මුළුමනින් ම එංගලන්තයේ පවතින තත්වය අංගලක්ෂිත කරන අතර, විප්ලවවාදී තත්වයක ආර්ථික හා සමාජ පූර්වාවශ්‍යතා එහි පවතින බවත් දිනපතා ඒවා වඩ වඩාත් උග්‍ර වන බවත් අපට කිව හැකිය. එහෙත්, අප විප්ලවවාදී තත්වයක් අර්ථ විවරණය කරන්නේ සමාජ විද්‍යාත්මකව පමණක් නොව දේශපාලනිකව බවත් මීට මනෝබද්ධ සාධකය ඇතුළත් වන බවත් අප අමතක නො කළ යුතුය. එසේ ම මනෝබද්ධ සාධකය යනු කම්කරු පන්තියේ පක්ෂය පිළිබඳ ප්‍රශ්නය පමණක් නොවේ. එය සියලු පන්තීන්ගේ, නිසැකව ම ප්‍රධාන වශයෙන් කම්කරු පන්තියේ හා එහි පක්ෂයේ, විඥ්ඥාණය පිළිබඳ ප්‍රශ්නයකි.
3. කෙසේ වතුදු, විප්ලවවාදී තත්වයක් ආරම්භ වන්නේ විප්ලවයක් සඳහා වන ආර්ථික හා සමාජ පූර්වාවශ්‍යතා මගින් සමාජයේත් එහි විවිධ පන්තීන්ගේත් විඥ්ඥාණයෙහි හදිසි වෙනස්කම් ඇති කෙරෙන විට දී පමණි. කවර වෙනස්කම් ද?

(අ) අපගේ විශ්ලේෂණය සඳහා සමාජ පන්තීන් තුන එකිනෙකින් වෙන් කොට අප හඳුනා ගත යුතුය. ධනපති පන්තිය, මධ්‍ය පන්තිය හෝ සුලු ධනේශ්වර, සහ කම්කරු පන්තිය. මෙම පන්තීන්ගේ මානසිකයේ අවශ්‍ය වන වෙනස්කම් ඒ එකිනෙක පන්තිය සම්බන්ධයෙන් බෙහෙවින් වෙනස් වේ.

(ආ) සියලුම න්‍යායඥයන්ට වඩා හොඳින්, බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය ආර්ථික තත්වය අතිශය බැරෑරුම් බව ඉතා මැනවින් දනී. එහෙත් විප්ලවවාදී තත්වය දිග හැරෙන්නේ, පැරණි සමාජයේ පදනම මත නොව, පවතින පර්යායට එරෙහිව විප්ලවවාදී නැගිටීමක මාවත ඔස්සේ ගැළවීමේ මගක් සෙවීමට කම්කරු පන්තිය පටන් ගන්නවාත් සමග ය. විප්ලවවාදී තත්වයක් සඳහා වන ඉතාම වැදගත් මනෝබද්ධ කොන්දේසිය මෙයයි. මහජනයාගේ විප්ලවවාදී හැඟීම්වල තීව්‍රතාව වනාහි විප්ලවවාදී තත්වයෙහි පරිණත භාවය පිළිබඳ අතිශය වැදගත් ඇඟවීම් වලින් එකකි.

(ඇ) එහෙත් විප්ලවවාදී තත්වයක් යනු, එළඹෙන කාල පරිච්ඡේදයේ දී කම්කරු පන්තියට සමාජයේ පාලක බලය බවට පත් වීමට ඉඩ සලසන්නාවූ එකකි. එය රැදී පවතින්නේ, අනෙකුත් රටවලට වඩා එංගලන්තය සම්බන්ධයෙන් අඩුවෙන් වුව ද, එක්තරා දුරකට මධ්‍යම පන්තියේ දේශපාලන චින්තනය හා මනෝගතිය මතය. සියලු සම්ප්‍රදායික පක්ෂ කෙරෙහි (ප්‍රතිසංස්කරණවා දී, එනම් ගතානුගතික පක්ෂයක් වන ලේබර් පක්ෂය ද ඇතුළු වු) එහි විශ්වාසය භංග වීමත් සමාජයේ රැඩිකල්, විප්ලවවාදී වෙනසක් (ප්‍රතිවිප්ලවවාදී එනම්, ෆැසිස්ට් වෙනසක් නොව) පිළිබඳ එහි බලාපොරොත්තුව වේ.

(ඈ) තම පද්ධතිය බේරා ගැනීමට තමන්ට නො හැකි බව පෙනී යාමත් සමග තමන් කෙරෙහි ම විශ්වාසය භංග වී බිඳී විසිරෙන්නටත් කණ්ඩායම් හා කල්ලිවලට බෙදෙන්නටත් පටන් ගන්නා පාලක පන්තියේ මනෝගතියෙහි ඇති වන වෙනස්කම්වලට අනුරූපව හා සමාන්තරව කම්කරු පන්තියේ සහ මධ්‍යම පන්තියේ මනෝගතියෙහි වෙනස්කම් ඇති වීම.

4. මෙම ක්‍රියාදාමයන්හි කවර ලක්ෂ්‍යකදී විප්ලවවාදී තත්වය පරිපූර්ණ ලෙස පරිණත වන්නේ ද යන්න කල් තියා දැනගැනීමය හෝ වීජ ගණිතමය ලෙස සලකුණු කිරීමට හෝ නො හැකිය. විප්ලවවාදී පක්ෂයට එම කරුණ තිර කළ හැක්කේ අරගලය තුළ දී පමණි. ගොවීන් හා නගරබද සුලු ධනේෂ්වර කොටස් යනාදිය ඇතුළත් මහජනයා මත තම බලවේග හා බලපෑම් වැඩි දියුණු වීම ද පාලක පන්තියේ ප්‍රතිරෝධය දුබල වීම ද මගිනි.

5. අප මෙම නිර්ණායකයන් බ්‍රිතාන්‍යය සම්බන්ධයෙන් යොදතොත් අපට පෙනී යන්නේ,

අ. ආර්ථික හා සමාජ පූර්වාවශ්‍යතා පවතින්නේ ය යන්න සහ ඒවා වඩාත් බලගතු ද බරපතළ ද වන්නේ ය යන්න.

ආ. කෙසේ වතු ද මෙම ආර්ථික පූර්වාවශ්‍යතා සහ මානසික ප්‍රතිචාරය අතර පාලම තවමත් ගොඩ නැඟී නැත යන්න. එංගලන්තය තුළ දී අවශ්‍ය වන්නේ, දැනට මත් නො ඉවසිය හැකි වන ආර්ථික කොන්දේසිවල වෙනසක් නොව, එරටෙහි පවත්නා මෙම නොඉවසිය හැකි විනාශකාරී තත්වය කෙරෙහි විවිධ පන්තීන්ගේ ආකල්පයෙහි වෙනසකි.

6. සමාජයක ආර්ථික වර්ධනය යනු ශතවර්ෂ හා දශක වලින් ගණන් ගැනෙන අතිශය ක්‍රමික ක්‍රියාදාමයකි. එහෙත් ආරථික කොන්දේසි රැඩිකල් ලෙස වෙනස් කෙරුණු විට දී කල් පසු වී ඇති මානසික ප්‍රතික්‍රියාවන් කඩිනමින් මතු විය හැකි ය. කඩිනමින් වුව ද හෙමින් වුව ද එවැනි වෙනස්කම්, නො වැළැක්විය හැකි ලෙස පන්තීන්ගේ මනොගතිය කෙරෙහි බලපෑ යුතුය. අපට විප්ලවවාදී තත්වයක් ලැබෙන්නේ එවිට දී පමණි.

7. දේශපාලන අර්ථයෙන් මෙහි තේරුම:

අ. කොන්සර්වැටිව් හා ලිබරල්වරුන් කෙරෙහි පමණක් නොව, ලිබරල් පක්ෂය කෙරෙහි ද කම්කරු පන්තිය සිය විශ්වාසය නැති කර ගත යුතු ය. එය තම අධිෂ්ඨානය හා ධෛර්යය විප්ලවවාදී අරමුණු හා විධික්‍රම කෙරෙහි සංකේන්ද්‍ර කළ යුතු ය.

ආ. මහ ධනපතියන් කෙරෙහිත් සාමිවරුන් කෙරෙහිත් විශ්වාසය බිඳ ගන්නා මධ්‍යම පන්තිය, විප්ලවවාදී කම්කරු පන්තිය වෙත සිය නෙත් යොමු කළ යුතුය.

ඇ. මහජනයා විසින් ප්‍රතික්ෂේප කෙරුණු දේපොළ හිමි පන්තීන් හා පාලක කල්ලි තමන් කෙරෙහි ම විශ්වාසය නැති කර ගත යුතුය.

8. මේ ආකල්පයන් නොවැළැක්විය හැකි ලෙස ම වර්ධනය වනු ඇත. එහෙත් ඒවා අද දින නො පවතී. බරපතළ අර්බුදය නිසා එය කෙටි කාලයක් තුළ දී වර්ධනය විය හැකි ය. ඒවා අවුරුදු දෙක තුනක දී හෝ අවුරුද්දක් තුළ දී පවා හෝ වර්ධනය විය හැකි ය. එහෙත් අද දින මෙය පවතින්නේ ඉදිරි

දර්ශනයක් වශයෙනි. සාධකයක් වශයෙන් නො වේ. අප අපේ පිළිවෙත පදනම් කළ යුත්තේ අද දින කරුණු මත මිස හෙට දින කරුණු මත නොවේ.

9. විප්ලවවාදී තත්වයක් සඳහා දේශපාලන පූර්වාවශ්‍යතා එක් විට දී ම හා අඩු වැඩි තරමින් සමාන්තරව වර්ධනය වන්නේ නමුදු, එහි තේරුම වන්නේ ඒ සියල්ල එක් මොහොතකදී පරිණත වන්නේ ය යන්න නො වේ. ඉදිරියේ පවතින අන්තරාය එයයි. පරිණත වන දේශපාලන කොන්දේසි යටතේ අතිශයින් ම අපරිණතව පවතින්නේ කම්කරු පන්තියේ විප්ලවවාදී පක්ෂයයි. කම්කරු පන්තියේ හා මධ්‍යම පන්තියේ පොදු විප්ලවවාදී පරිවර්තනය හා පාලක පන්තියේ දේශපාලනික බිඳී විසිර යාම, කොමියුනිස්ට් පක්ෂයේ පරිණත වීමට වඩා ඉක්මණින් වර්ධනය විය හැකිය යන්න නො තකා හරිනු නොලැබේ. මෙහි අර්ථය වන්නේ, අවශ්‍ය තරමේ විප්ලවවාදී පක්ෂයකින් තොරව අව්‍යාජ විප්ලවවාදී තත්වයක් වර්ධනය විය හැකිය යන්න යි. එය එක්තරා දුරකට 1923 ජර්මනියේ පැවති තත්වයේ පුනරුච්චාරණයක් වනු ඇත. එහෙත් මෙය අද එංගලන්තයේ පවතින තත්වය යැයි කිම මුළුමනින් ම වැරදි වේ.

10. විප්ලවවාදී තත්වයෙහි අනෙකුත් මූලිකාංගවලට පසු පසින් පක්ෂයේ වර්ධනය සිදුවිය හැකිය යන්න අප නොතකා හරින්නේ නැත. එහෙත් මෙය නොවැළැක්විය හැක්කක් නොවේ. අපට නිශ්චිත අනාවැකියක් පළ කළ නොහැකිය. එහෙත් එය අනාවැකියක් පළ කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එය අපේ ම ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රශ්නයකි.

11. ධනපති සමාජයේ මෙම අවස්ථානුගත තත්වයේ දී ධනපති පක්ෂ තුන සමඟ පවත්නා සිය සම්බන්ධතා බිඳ ගැනීමට බ්‍රිතාන්‍ය කම්කරු පන්තියට කොතරම් කාලයක් අවශ්‍ය වේද? අනෙකුත් පක්ෂවල බංකොලොත් භාවයේත් බිඳි විසිර යාමේත් ප්‍රමාණයට අනුරූපව නිවැරදි පිළිවෙතක් සහිත කොමියුනිස්ට් පක්ෂය වැඩී යාමට මුළුමනින්ම ඉඩ ඇත. මෙම සක්‍යතාවන් සාක්ෂාත් කිරීම අපගේ අරමුණ හා යුතුකම වෙයි.

**නිගමනයන් :**

එංගලන්තයේ පවතින දේශපාලන ගැටීම ප්‍රජාතන්ත්‍රවාදය හා ෆැසිස්ට්වාදය අතර යැයි කීම මුළුමනින්ම වැරදි වන්නේ ඇයිදැයි මෙයින් ඇති තරම් පැහැදිලි වෙයි. ෆැසිස්ට්වාදයේ අවධිය බැරෑරුම් ලෙස ආරම්භ වන්නේ කම්කරු පන්තියට එරෙහිව ධනපති පන්තිය ලත් වැදගත් වනනා වූ යම් කාල පරිච්ඡේදයකට තිරණාත්මක වන්නා වූත් ජයග්‍රහණයකින් පසුව ය. කෙසේ වතුදු එංගලන්තයේ දැවැන්ත අරගල එළඹෙනු ඇත්තේ ඉදිරි කාලයේ දී ය. වෙනත් අවස්ථාවක දී අප විසින් සාකච්ඡා කෙරි ඇති පරිදි ජාතික ආණ්ඩුවේත් එයින් පසුව එළඹීමට ඉඩ ඇති කොන්සර්වැටිව් ආණ්ඩුවේත් වැටීමට පසුව බලයට පත් වීමට බෙහෙවින් ඉඩ ඇත්තේ ෆැසිස්ට්වාදයේ අවතාරයට ද වඩා නුදුරු අනාගතයේ දී භයානක විය හැකි ලිබරල්-ලේබර් ආණ්ඩුවකි. කොන්දේසි සහිතව අපි ඊට බ්‍රිතාන්‍ය කෙරෙන්සිකිවාදයේ කාල පරිච්ඡේදය යැයි කියමු.

කෙරෙන්ස්කිවාදය හැම අවස්ථාවකදී ම හා හැම රටක දී ම රුසියානු කෙරෙන්ස්කිවාදය මෙන් අවශ්‍යයෙන් ම දුර්වල වනු නැත යන්න ද මෙහි දී කිව යුතු වේ. රුසියානු කෙරෙන්ස්කිවාදය දුර්වල වුයේ බොල්ශේවික් පක්ෂය ශක්තිමත්ව පැවති හෙයිනි. උදාහරණ වශයෙන් ස්පාඤ්ඤයේ දී කෙරෙන්ස්කිවාදය ලිබරල්වාදීන්ගේ හා "සමාජවාදීන්ගේ" සභාගය කිසි ලෙසකිනුත් රුසියාවේ දී මෙන් දුර්වල නො වේ. ඊට හේතුව, කොමියුනිස්ට් පක්ෂයේ දුර්වලත්වයයි. කෙරෙන්ස්කිවාදය, ස්පාඤ්ඤ විප්ලවයට බරපතළ අනතුරකි. කෙරෙන්ස්කිවාදය, ප්‍රතිසංස්කරණවාදී, "විප්ලවවාදී," "ප්‍රජාතන්ත්‍රවාදී", " සමාජවාදී" වාක්‍ය ඛණ්ඩ හා ද්විතීයික ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ප්‍රතිසංස්කරණ පිළිබඳ පිළිවෙතක් කම්කරු පන්තියේ වාමාංශයට එරෙහි මර්දනයේ පිළිවෙතක් සමඟ ඒකාබද්ධ කරයි.

මෙය ෆැසිස්ට්වාදයේ විධික්‍රමයට පටහැණි වුව ද එය එම ඉලක්කය ම සපුරාලයි. අනාගත ලොයිඩ් ජෝර්වාදය පරාජය කරනු හැක්කේ එහි එළඹීම අප විසින් පෙරදකිනු ලැබෙතොත් පමණි. ලොයිඩ් ජෝර්ජ්ගෙන් ද හෙට දින ඔහුගේ උපකරණය වන ලේබර් පක්ෂයෙන් ද පවතින අනතුරට වඩා දුරස්ථ අනතුරක් ලෙස අද පවතින ෆැසිස්ට්වාදයේ අවතාරයෙන් අප මෝහනට පත් නොවන්නේ නම් පමණි. හෙට දින අනතුර විය හක්කේ ප්‍රතිසංස්කරණවාදී පක්ෂයයි; ලිබරල්වාදීන්ගේ හා සමාජවාදීන්ගේ පෙරමුණ යි. ෆැසිස්ට් අනතුර තවමත් අවධින්

තුනක් හෝ හතරක් එපිටිනි. ෆැසිස්ට් අවධිය අතු ගා දැමීමේ සහ ප්‍රතිසංස්කරණවාදි අවධිය අහෝසි කිරිමේ හෝ හීන කිරිමේ අපේ අරගලය වනාහි කම්කරු පන්තිය, කොමියුනිස්ට් පක්ෂය වෙත දිනා ගැනීමේ අරගලයකි.

පරිවර්තනය: විජේ ඩයස්.

කම්කරු මාවත ප්‍රකාශනයකි.